## මුතු කරාඩුව



# මේ රැයේ මිහිරිම වෙලාවයි

මිදුලක්.
රාත්‍රියක්.
සඳක්. උදුල මිණි පහනක් සදිසි සඳක්.
සඳ එළියෙන් නැහැවෙන තුරු වියනක්. තරු එළි වලට තරඟයක් දෙන්නට මෙන් තම තමන්ගේ ලාම්පු රැගෙන ඔබ මොබ සරන කණාමැදිරියන් දහස් ගණනක්. ඇඟ හී ගඩු නගන මඳ සුළඟක්. ඉඳ හිට ඇහෙන බස්සෙකුගේ "හ්ම්"සරයක්.
මම මෙතන මේ ලියන මේසය ළඟ.
ඔබ. ඔතන. මිදුලේ.

ඔබ කළුවරේ මිදුල මැදට සෙමින් ඇවිද යනවා. කෙදිනක හෝ වීද මෙතරම් අපූරු රැයක්? විඳ ගන්නට දෑස් මදියි හිතෙන තරමටම සොඳුරු රැයක්? සඳ දිදුලමින්, තරු හිනැහැමින්, කොඳ කැකුළු ඇහැරෙමින් බල බලා ඉන්නේ කවුරුන් එනතුරුද? ඔව්. ඔබට හිතුණා හරි. ඒ හැම අසිරියක්ම ඔබේ දරුවා වෙනුවෙන්.

ඉතින්, නොපමාව ගයන්න. සෙමින්. මඳ සුළඟ ඔබේ ඇරයුම ගෙතුළට ගෙන යනු ඇත.

මගෙ දූවේ ඔබ අවදියෙන් නම්
මේ රැයේ මිහිරිම වෙලාවයි
දොර ඇරන් එළියට ආවොතින්
මේ මිහිරි දේවල් නුඹටමයි[1]

මේ රැය ද, අසිරිමත් මහ පොළොව ද, කළු පොරවාගත් අහස ද, නිම්නැති තාරකා මන්දාකිණිය ද මතු නොව මුළුමහත් විශ්වයම ඔවුන්ගේය. ඒ බව ඔවුන්ට කියාදෙන්න. ඔබ හිස මුදුනේ දිලෙන මේ සඳම අසංඛ්‍ය වාර ගණනක් කවි නිමිත්තක් වූ හැටි- සේකර නමින් පොළෝ මත පහළ වූ මිනිසෙකු ඒ සඳ සහ අපේ ආත්මීය බැඳීම පත් ඉරුවක් මත සිත්තම් කළ හැටි- දරුවන්ට කියා දෙන්න.

මොහොතක් නැවතී මා දෙස
ආදරයෙන් බලන කෙනෙක්
වග තුග අසන කෙනෙක්
දන්නා අඳුනන්නෙක්
මෙතන නො මැත
ඒ හැම දෙන මහ පොළොවේ අනිත් පැත්තෙ
මට සිහි වෙයි.

මහා දුකින් ඉහළ බලමි.

දිලිහි දිලිහි ආකාසේ
රන් පිඟාන සේ හඳ.
මා දන්නා අඳුනන
අපේ ගමේ වෙල් එළියට පායන හඳ
පෝය දාට බෝ මළුවට පායන හඳ.[2]

<u>දරුවන් සොයන්නෝය.</u>

"ඔවුන්ගේ මනස් විවර කිරීම ප්‍රමාණවත්ය. ඒවාට ඕනෑවට වඩා බර නොපටවන්න. ගිනි පුපුරක් පමණක් එහි දමන්න. ගිනි ගන්නා සුළු කිසියම් දෙයක් එහි වේ නම් එය ගිනි ගනු ඇත."[3]
ඔවුන්ගේ විමසුම් මනස පුබුදු කරන්නට ඔබට හැකි නම් ඔවුහු ඒ සොයා ගනු ඇත.

<u>දිනෙක ලෝකය වෙනස් කරන්නෝ ඔවුන්ය.</u>

අපට අපේ ජීවිත තුළ කිසිකලෙක අත් විඳිය නොහැකි "යහපත් ලෝකය" පිළිබඳව හීනයේ යෂ්ටිය නිසි ලෙස ඔවුන් අතට පත් කළ යුතුය. "යහපත් ලෝකයක්" යනු ආගම්වල එන පාර-ලෞකික මෝක්ෂයක් හෝ බඩගෝ-ස්තරවාදී වෙළෙන්ඳන් විසින් සූත්‍ර ගත කරනු ලැබ ඇති කිසියම් "සොමියක්" නොව හුදෙක් අනෙකාගේ පැවැත්ම පිළිගැනීමෙන්, ඒ වෙනුවෙන් වැඩ කිරීමෙන්, එනම් ආදරය කිරීමෙන් උදා වෙන්නක් බව ඔවුන්ට කියාදෙන්න.

නිදහස හෝ විමුක්තිය යනු මොබයිල් ෆෝන් වලින් හෝ මැක් රයිස් වලින් හෝ හැරී පොටර්ගේ මැජික් පොල්ලෙන් හෝ උපදින්නක් නොව, මිනිස් වර්ගයා විසින් මහපොළොව මත රුහිරු වගුරවමින් උදා කරගත් කිසිවක් බව ඔවුන්ට කියාදෙන්න.

මහපොළොව මත ඇත්තේ එකම මිනිස් වර්ගයක් බවත්, කොන්දේසි විරහිතව අප කැපවිය යුත්තේ සියළු බෙදුම් රේඛා අතුරුදහන් වී- ආදරය ජයග්‍රහණය කරන අනාගත දිනය වෙනුවෙන් බවත් ඔවුන්ට කියාදෙන්න.

<u>දරුවන්ට දිය හැකි උතුම්ම තෑග්ග පොත්ය. ඒ මවුකිරි තරමටම අගනේය.</u>

හිනාවෙන්නවත් මතක නැති, රබර් බෝනික්කන් බඳු කෙටි දුර ධාවන ශූරයන් මැද්දෑවේ පොත පත කියවන, කවි ලියන දරුවන් හමු වීමම මංගල කාරණයකි. මේ එබඳු හමුවීමක්. අසන්න.

දඟ කරන
ගං දිය
සිසිලස නිල්
අහස යට......
බරක් නොවූ
පොළොවට
බලා හිඳී
තනිවම.....
ගං ඉස්මත්තට
පායාපු.....
සඳ රැස්
කාන්තියෙන් බරව
අසල බට පඳුර
ළඟ.....
නිහඬ කතාවක්
හරියට.....
වෙනදාට වඩා අද
හැඩයි බට
පඳුර ළඟ[4]

ලෝකය විඳින- ඒ විඳීම් ප්‍රතිනිර්මාණය කොට අන්‍යයන් සමග බෙදා ගන්නට සිතන මේ දරුවන් රෑ කළුවර අහසේ මතුව එන තරු එළි නොවේද? එහෙත්, ක්ෂණික ආලෝකයක් විහිදුවා කඩා වැටී මිය යන උල්කාශ්මයන් සේ ඔවුන් පිළිබඳව වූ අපේ බලාපොරොත්තු මිය යන්නේ ඇයි? ඒ ගැන දරුවන්ටම කතා කරන්නට දෙමුද? අහගෙන ඉන්න.

ගමට එන්න ආසයි
මට අම්ම බලන්න
කොහෙන්ද මට ඊට ඉඩක්
එහෙම කරන්න

හැමදාමත් ගමේ ළමයි පාසල් යන්නේ
අම්මගෙ තුරුලටම වෙලා එයාල ඉන්නේ
මා විතරක් මෙහෙටම වී දුකෙන්ම ඉන්නේ
අනේ අම්මෙ මාව මෙහෙන් එක්කන්
යන්නේ

ලස්සන ගවුමක් ඇඳලා නට නට ඉන්න
ඔය සුන්දර ලෝකෙට මට ආසයි එන්න
කැලේ තියන පළතුරු මට ආසයි කන්න
අනේ අම්මෙ මාව මෙහෙන් එක්කන්
යන්න[5]

ඊගාවට පෙන්වන්නට යන්නේ මට මෙතෙක් හමුවූ අව්‍යාජම කවියයි.

අම්මා මගේ හරී සුදුයි
අම්මා මගේ හරී හොඳයි
මම අම්මට ආදරෙයි
අම්මත් මට ආදරෙයි

අම්මා මට කිරි දුන්නා
අම්මා මට බත් කැවුවා
අම්මාගෙන් බත් කෑවා
මට හොඳ ළමයා කිව්වා[6]

මේ කව ලියා ඇත්තේ පාසැලේ විශේෂ අධ්‍යාපන ඒකකයේ ඉගෙන ගන්නා දරුවෙක්. කවි යනු හැඩයක් නොමැති සිතිවිලි වලට අකුරු වලින් හැඩයක් ලබා දීමය. මේ පුංචි කවියාගේ නිර්මල සිතෙහි පහළ වූ සිතිවිල්ලේ හැඩය හඳුනාගත හැකි ඊනියා විචාර ක්‍රමවේදයක් තිබෙන්නේ කොහේද? සුමට නොවූ ළමා අකුරෙන් එක්සයිස් පොතක රූල් අස්සේ පැන්සලකින් කවි ලියන දරුවෙක්. මරණයම එකම යැදුම කර ගත් අමනයන් මැද ආදරය ගැන කවි ලියන දරුවෙක්.
අම්මේ, තාත්තේ, ඒ පැන්සලය උදුරා විසි කරන්නට එපා...! අපේ සියළු බලාපොරොත්තු ඔහුගේ පැන්සලයේ හිර වී තිබේ.

අඟුරු කැටකින් බිතක සිත්තමක් ඇඳ අම්මාට පෙන්වන දරුවෙකු සිහියට නගා ගන්නට ඔබට පුළුවන්ද? දරුවෙකු සිය නිර්මාණශීලී හැඟුම් මුල් වරට ලෝකයට පෙන්වන මොහොත එයයි. තමා තුළ බිහිවෙන සිතිවිලි ලෝකයට පුදන අනාගත නිර්මාණකරුවාගේ තිඹිරි ගෙය එයයි.
ප්‍රකට චිත්‍ර ශිල්පිනියක[7] සිය බාල කාලය සිහි ගන්වමින් වරෙක කී දෙයක් සිහියට නැගෙයි. කුඩා කල හුණු කූරකින් සිමෙන්ති පොළොවේ ඇඳි සිත්තම් නොමැකෙන සේ ඒවා උඩින් පැන පරිස්සමින් එහා මෙහා ගිය තාත්තාව ඈ සිහිපත් කරන්නේ කෘතවේදී හැඟීමෙන්. දරුවෙකු බිත්තියක අඳින සිත්තමක් දැක සතුටු වීම වෙනුවට බිත්තියේ ගෑ "නෝනට ගැලපෙන තීන්ත" ගැන වොරි වෙන අම්මලා තාත්තලා විසින් වනසන්නේ අපේ සාමූහික ප්‍රාර්ථනයයි.

දැන් ලියන මේසය ළඟින් නැගිටින්නට වෙලාව ඇවිත්. මන්දා ඔබ තවම මිදුලේද? පොඩි එකා ඔඩොක්කුවේ නිදි ඇති මෙලහකට.
එයාගෙ හිස අතගාමින් සිහි කරන්නට ගීයක් මතක් කරන්නද? අපමණ දුක් විඳිමින් වැදූ, දහදිය කඳුළු හෙලා දැඩි කළ ඔබේ දරුවා නව මිනිසෙකු කොට නව ලොවට පුදන්නට අවැසි දිරිය ඒ ගීය දිගේ ඔබ වෙත ඒවි.
කරදිය ගැඹරේ තුන්යම ගෙවුණේ
නුඹගේ දෑතට දිරිය වඩන්නයි
සුහුඹුල් අත් පා යදඬු කරන්නයි
කිරි කැටි පුතුනේ

අව්වට වැගිරෙන දාදිය වැස්සේ
කළුගල් තළලා මහ මං තැනුවේ
නිවහල් ලොවකට නුඹට වඩින්නයි
කිරි කැටි පුතුනේ

දුම්රොටු අතරේ කම්හල් ඇතුළේ
දැති රෝදෙට ගත ජීවය දුන්නේ
නව මිනිසෙකු නව ලොවට පුදන්නයි
කිරිකැටි පුතුනේ[8]

1. දිවුල්ගනේ ගැයූ ප්‍රකට ගීයක්. (ගේය පද- රත්න ශ්‍රී විජේසිංහ)
2. සේකර. "බෝඩිම". "සඳ සහ නිව්යෝක් නුවර"
3. ඇනටෝල් ෆ්‍රාන්ස්. උපුටනය- ටී. අන්ද්‍රාදිගේ "විශ්ව ග්‍රන්ථාවලියෙන් ඡේද කෝෂයක්"
4. සරසි ප්‍රභානි කල්පා (8 ශ්‍රේණිය- බප/ කැල/ ජයකොඩි මහා විදුහල). "ගං දිය".
5. කෝසලී ලක්මාලි (10 වසර- ශාන්ත සෙබස්තියන් විදුහල - එඬේරමුල්ල). "ආසයි මට ගමට එන්න".
6. ධනුෂ්ක ප්‍රසාද් (විශේෂ අධ්‍යාපන ඒකකය- බප/ කැල/ ජයකොඩි මහා විදුහල). "අම්මා"
(දරුවන්ගේ නිර්මාණ "ආසයි මට ගමට එන්න" නිර්මාණ සංග්‍රහයෙන්)
7. චම්පානි දේවිකා. ඈ සිත්තම් සහ කවි එක් කොට තනා ගත් අපූරු ප්‍රකාශන මාධ්‍යයක නියැලෙන- දරුවන්ට සිත්තම්කරණය උගන්වන චිත්‍ර ශිල්පිනියක්.
8. එඩ්වඩ් ජයකොඩි ගැයූ ප්‍රකට ගීයක්. (ගේය පද - ප්‍රේමකුමාර ජයවර්ධන. මියැසිය- රෝහණ වීරසිංහ.)

——— තරංග ජයසේන




